# වෙළඳ අමාත්‍යාංශය
# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## තනතුරු පුරප්පාඩු

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව
භාර අරමුදලෙහි පහත සඳහන් තනතුර සඳහා නිසි සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයෙහි නියුතු අයදුම්කරුවන් පූර්ණකාලීනව ආයතනයෙන් නිදහස් කළහැකි බවට නිර්දේශ කරමින් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත්‍ර යොමු කළ යුතු ය.

## අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)

**1. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:**

**I.1 බාහිර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය, මූල්‍ය, වාණිජ්‍යය, නීතිය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු පරිපාලන මූල්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ලබා තිබීම සහ එයින් වසර 05 ක් රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාගත මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ගිණුම්කරණය, කළමනාකරණ , මූල්‍ය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක සම සාමාජිකත්වය දරා තිබීම සහ සාමාජිකත්වය දැරීමෙන් අනතුරුව පරිපාලන මූල්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද සහ එයින් වසර 05 ක් රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාපිත මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**1.2 ද්විතියන පදනම මත ( Secondment ) හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවාගැනීම:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය, මූල්‍ය, වාණිජ්‍යය, නීතිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ කාණ්ඩයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවයක් සහිතව පළපුරුද්ද ලබා තිබීම.

සටහන :
අභ්‍යන්තර අයදුම්කරුවන් කෙරෙහි වැඩි කැමැත්තක් දක්වනු ලැබේ. ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් පැවතීම අමතර සුදුසුකමක් වේ.

**2. වැටුප් පරිමාණය :**

HM 2-3 : රු. (98,215 - 12 x 2,700 - 130,615)
EPF -15%, ETF – 3%, ජීවන වියදම් දීමනාව, පැමිණීමේ දීමනාව (රු.10,000/-) සහ සෞඛ්‍ය රක්ෂණාවරණය

**වෙනත්:**

**සෑම අයදුම්කරුවෙක් ම :**

- **වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සහ ද්විතියික පදනම මත ( Secondment ) අයදුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ඉහළ වයස මට්ටම බල නොපානු ලැබේ.**
- තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතු අතර දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවිය යුතුය. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ .
- **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගැනීම සිදු කරනු ලැබේ.**

1. සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ජාතිය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් සඳහන් කළ යුතු තොරතුරු අතුළත් ඥාතීන් නොවන පුද්ගලන් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමඟ **ලේකම් , වෙළඳ අමාත්‍යාංශය, සතොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021/03/01 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

- අයදුම්පත්‍ර කෙටි ලේඛනගත කිරීමේ අයිතිය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් දරනු ලැබේ.
- අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර භාර ගනු නොලැබේ.
- මේ සම්බන්ධයෙන් ඔබ විසින් වැය කරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

ලේකම්
වෙළඳ අමාත්‍යාංශය
සතොස මහලේකම් ගොඩනැගිල්ල , 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

Source: Dinamina, Daily News (2021.02.15)